**ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 29 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,691.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,194.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 496.78 ක් හෙවත් සියයට 13.46 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,589.35 | 2,302.46 | 286.89 | 11.08 |
| මූලධන | 1,102.00 | 892.11 | 209.89 | 19.05 |
| **එකතුව** | **3,691.35** | **3,194.57** | **496.78** | **13.46** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 19.06 | 18.82 | 12.06 | 18.75 | 50.00 | 36.88 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0300/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 79.47 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 7.55 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0105/000 | 0.33 |
| 6000/0000/00/0002/0145/000 | 0.35 |
| 6000/0000/00/0013/0100/000 | 1.67 |
| 6000/0000/00/0016/0091/000 | 5.00 |
| 6000/0000/00/0018/0095/000 | 0.20 |
| **එකතුව** | **7.55** |

## 2.5 විගණන නිරීක්ෂණය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (iii) | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (iv) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | යාවත්කාලින කර නොතිබුණි. |
| (vi) | නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 29301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,189,542 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ මාස 06 ක සිට වර්ෂ 06 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.115,103 ක් හිඟ හිටි ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) මිය ගිය හා විශ්‍රාමගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 107,010 ක මුදල වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවැත එමින් තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) | ලොරි රථ | 01 | 550,000 | වර්ෂ 03 |
| (ii) | ජීප් රථ | 01 | 400,000 | මාස 08 |
| (iii) | ත්‍රී වීල් | 01 | 299,975 | මාස 10 |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල දෙකකට අදාළව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව නාගොඩ, ඉංගිරිය හා බුලත්සිංහල නිල නිවාසවල සවිකර තිබුණු විදුලි පංකා 12 ක්, රෙගියුලේටර් 08 ක් හා වතුර ටැංකි (500 L) 02 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) දෙහිඔිවිට කොට්ඨාශයේ රබර් සංවර්ධන නිලධාරී නිල නිවාස 04 ක අලුත්වැඩියා කටයුතු සිදු කර ඇති අතර එහිදී ගලවා ඉවත් කරන ලද ද්‍රව්‍ය 2015 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරන අවස්ථාවේදී අදාළ පරිශ්‍රවල ගොඩගසා තිබෙන බව වාර්තා කර තිබුණි.

(iv) කඹුරුපිටිය හා ඇල්පිටිය රබර් සංවර්ධන නිලධාරී කාර්යාලවල තිබෙන මේස 04 ක්, ඇඳි පුටු 04 ක්, ප්ලාස්ටික් පුටු 06 ක්, සාමාන්‍ය පුටු, කුෂන් පුටු 04 ක් හා ලාච්චු දෙකේ ලිපිගොනු කබඩ් 01 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොමැති බව භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අනාවරණය වී තිබුණි.

(v) ඇගල්ඔය පැල තවානේ පැරණි ගොඩනැගිලිවලින් ගලවා ඉවත් කරන ලද වටිනාකමකින් යුත් උළුවහු හා ලීදඬු ගොඩගසා ඇති බවත්, ඒවා දිනෙන් දින දිරාපත් වෙමින් පවතින බවත්, සමීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි.

(vi) ගුරුගොඩ රබර් පැල තවානේ තිබෙන කැබ් රථයක් හා එහි ජලනල පද්ධතිය ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොමැති බව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකකට වඩා අඩු කාලයක සිට පැවත එන බැරකම් රු.76,838,381 ක් විය.

**3.4 කාර්යසාධනය**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවට අයත් රබර් පැල තවාන් 7 කින් සමාලෝචිත වර්ෂයේදී රබර් පැල 1850000 ක් නිෂ්පාදනය කිරීමට සැලැසුම් කළද, වර්ෂය අවසාන වන විට රබර් පැල 1386593 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව රබර් පැල නිෂ්පාදනයේදී ඉලක්කගත රබර් පැල ප්‍රමාණයට වඩා සියයට 25 ක් අඩුවෙන් පැල නිෂ්පාදනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ ව්‍යාපෘති 03 ක් සඳහා රු.මිලියන 8.4 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘති සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2016 වර්ෂයට කල් දමා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාර් 11015 ක අළුතින් රබර් වගා කිරීමට සැලැසුම් කළද, වර්ෂය අවසාන වන විට හෙක්ටයාර් 1160 ක් හෙවත් සියයට 10 ක ප්‍රමාණයක රබර් වගා කර තිබුණි.

**3.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**---------------------------**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් වල වටිනාකම රු.1,731,388 ක් වී තිබුණි. එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රබර් මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට රු.මිලියන 329 ක් රබර් සහතික මිල සහනාධාර ගෙවා තිබූ අතර එයින් රු.මිලියන 11.5 ක සාවද්‍ය ගෙවීමක් බැවින් එය අය කර ගත යුතු බවට කමිටුවක් විසින් නිර්දේශ කර තිබුණි. එකී මුදල අය කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සහතික මිල ගෙවීමේ ක්‍රමවේදය යටතේ 2015 ජනවාරි 30 දිනැති අංක 2015/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව රබර් අක්කර 50 ට අඩු වගාකරුවන් පමණක් මේ සඳහා හිමිකම් ලැබුවත් අවස්ථා 06 ක දී අක්කර 50 ට වැඩි ඉඩම් හිමියන් සඳහා රු.2,031,252 ක සහතික මිල ලෙස ගෙවා තිබුණි.

(ඇ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙළඳ නියෝජිතයන් ඉදිරිපත් කළ RC 14 වාර්තා අනුව අවස්ථා 04 දී එකතුව කිලෝ 856.5 ක් සැපයූ බව දක්වා ගෙවීම් කර තිබුණද, සත්‍ය ලෙසම එවැනි සැපයුමක් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) හිමිකම් සහතික අංක RPS/1/32/12 යටතේ ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර රු.75,786 ක රබර් සහනාධාරයක් ලබාගෙන තිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

**-------------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2014 දෙසැම්බර් හා 2015 ජනවාරි කාලපරිච්ඡේදය තුළ නියෝජිත ආයතන දෙකක් විසින් තමන් මිලදීගත් රබර් ප්‍රමාණයට වඩා වැඩියෙන් තවත් ආයතනයට රබර් සැපයූ බව සඳහන් කරමින් රු.3,253,122 ක රබර් සහනාධාර වැඩිපුර ලබාගෙන තිබුණි.

(ආ) රබර් වගාකරුවන් 17 දෙනෙකු විසින් සපයන ලද රබර් කිලෝ 79529 කට අදාල RC 14 වාර්තා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෑගල්ල ප්‍රාදේශීයට එවා නොතිබූ අතර මෙම රබර් ප්‍රමාණය කුමන වගාකරුවන්ගෙන් මිලට ගත් රබර් ප්‍රමාණයන්ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව රු.7,555,302 ක සහතික මිලක් ගෙවා තිබුණි.

(ඇ) රබර් නියෝජිතගේ RC 14 වාර්තාවකට අනුව රබර් සැපයුම්කරුවකු විසින් රබර් කිලෝ 2463 ක් විකුණා තිබුණි. සැපයුම්කරුගේ RC 14 වාර්තාවට අනුව 2014 දෙසැම්බර් 20 දිනට පසුව ඔහු රබර් මිලට ගෙන තිබුණේ කිලෝ 576 කි. ඒ අනුව අදාළ කාලසීමාවට පෙර මිලටගත් රබර් කිලෝ 1887 ක් වෙනුවෙන් රු.179,265 ක රබර් සහනාධාර මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) 2015 ජනවාරි මාසයේදී වවුචර් 03 ක් මඟින් ගෙවන ලද රු. 136,237,660 ක් විධිමත් බලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

(ඉ) කළුතර දිස්ත්‍රික්කයේ රබර් සහනාධාර ගෙවීම් පිළිබඳ කරන ලද නියැදි විගණනයේදී, තෙවන ක්‍රමවේදය යටතේ රබර් වගාකරුවෙකු වෙත ඔහුට හිමිකම් පෑහැකි උපරිම කිලෝ ප්‍රමාණයට වඩා රබර් කිලෝ 970 ක් වෙනුවෙන් රු.291,000 ක් සහතික මිල ලෙස ලබාගෙන තිබුණි. දෙවන ක්‍රමවේදය යටතේ සහතික මිල සඳහා හිමිකම් පෑහැකි උපරිම රබර් කිලෝ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට සහතික මිල ගෙවීම හේතුවෙන් අවස්ථා 08 ක දී රු.731,272 ක මුදලක් වැඩිපුරද ගෙවා තිබුණි.

(ඊ) පැල ප්‍රවාහනය සඳහා යොදාගන්නා ලොරි රථවල මීටරය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතු බව උපදෙස් පත්‍රිකාවල සඳහන් කර තිබුණද, එසේ මීටරය ක්‍රියාත්මක නොවූ ලොරි රථ 03 කට රු.1,054,593 ක් ගෙවා තිබුණි.

(උ) නියැදි විගණන පරීක්ෂාවේදී රබර් මිලට ගත් වගාකරුවන් අතරින් හිමිකම් සහතික නොමැති වගාකරුවන් 16 දෙනෙකුගෙන් මිලදී ගත් රබර් කිලෝ 1028.5 ක් වෙනුවෙන් සහතික මිල ලෙස රු.97,707 ක් ගෙවා තිබුණි.

(ඌ) නියැදි විගණන පරීක්ෂාවේදී රබර් සැපයූ වගාකරුවන් 07 දෙනෙකු ඔවුන්ගේ උපරිම හිමිකම් ඉක්මවා රබර් සපයා තිබූ අතර ඒ වෙනුවෙන් රු. 58,757 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(එ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 17 දිනැති අංක RDD/3/2/Poly/2014-2 දරන ලිපියට අනුව තවාන් 05 කට අදාළව මිලදී ගත් පොලිතින් මළු 440,000 ක් රු.20,383,000 කට මිලදී ගෙන තිබුණත් පසුව එම පොලිතින් පිළිබඳව දෙවැනිවර සාම්පල් පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) පැල තවාන් 04 කට අදාළව මිලදී ගෙන තිබුණු රු.10,375,750 ක් වටිනා පොලිතින් මළු 3,025,000 ක් සැපයීම සඳහා නියමිත කාලයට වඩා මාස 2 ක සිට මාස 3 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු කර තිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ පරිගණක වැඩසටහන් ආශ්‍රයෙන් පරීක්ෂා කිරීමේදී වැඩිපුර ගෙවා තිබුණු බවට තහවුරු කර ගෙන තිබුණු රු.205,551 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාළව සහතික මිල ගෙවීමේදී RC 14 වාර්තා මඟින් අදාල තොරතුරු සහතික කර ගැනීමකින් තොරව ආයතන 03 කට එකතුව රු.7,443,769 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රබර් ප්‍රවාහනයට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව රබර් පැල 190598 ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. 2,051,745 ක් වැඩිපුර වැය කර තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබූ සම්මත දුර ප්‍රමාණයන්ට වඩා කි.මී. 2310 ක් වෙනුවෙන් රු. 321,090 ක් ගෙවා තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 25 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 03 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 364 | 310 | 54 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 72 | 69 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 15 | 15 | - |
| | **එකතුව** | **497** | **422** | **75** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 75 ක් පැවැතී තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතිම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදි නිරීක්ෂණය විය.